**මාධ්‍ය නිවේදනය**
**ඉ-ආර්ථික සංගණනය- 2026**

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**
**මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය**

**දත්ත මත පදනම් වූ ආර්ථික සැලසුම්කරණයට ශක්තිමත් පදනමක් සපයන ශ්‍රී ලංකාවේ ප්‍රථම ඉ-ආර්ථික සංගණනය ඇරඹෙයි; e-Census 2026**

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික නොවන ආර්ථික ක්‍රියාකාරකම් පිළිබඳ නවතම සහ විශ්වසනීය සංඛ්‍යාන තොරතුරු සම්පාදනය කිරීමේ අරමුණින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සිදු කිරීමට සැලසුම් කර ඇති ආර්ථික සංගණනය (කෘෂිකාර්මික නොවන ආර්ථික ක්‍රියාකාරකම්) 2025/2026ට අදාළව මාර්ගගතව ආයතනවල තොරතුරු රැස්කිරීම සඳහා වන ප්‍රථම ඉ-සංගණනය (e-Census) මෙවර ක්‍රියාත්මක වේ.

රටේ පවත්නා සියලුම කර්මාන්ත, ඉදිකිරීම්, වෙළෙඳ හා සේවා කටයුතු ආවරණය කරමින් සිදුකරනු ලබන මෙම ආර්ථික සංගණනයේ පළමු අදියර ලෙස, විශාල පරිමාණ ආයතනවල තොරතුරු රැස්කිරීම **2026 ජූලි මස 1** වැනි දින සිට ආරම්භ කිරීමට නියමිතය. ඒ අනුව මෙම නවීන ඩිජිටල් ක්‍රමවේදය යටතේ සේවක සංඛ්‍යාව **50** හෝ ඊට වැඩි විශාල පරිමාණ ආයතන සඳහා අන්තර්ජාලය ඔස්සේ ආරක්ෂිතව, පහසුවෙන් සහ කාර්යක්ෂමව සංගණන තොරතුරු ලබාදීමේ පහසුකම සලසා දී ඇත. මෙමගින් ආයතනවලට තමන්ට පහසු වේලාවක, ඕනෑම ස්ථානයක සිට ස්වාධීනව තොරතුරු ඉදිරිපත් කිරීමේ හැකියාව හිමි වේ.

මෙම ඩිජිටල් දත්ත රැස්කිරීමේ ක්‍රමවේදය මගින් දත්ත රැස්කිරීමේ ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂම, වේගවත්, පිරිවැය-ඵලදායී සහ පරිසර හිතකාමී වනු ඇති අතර, තොරතුරුවල නිරවද්‍යතාව, ගුණාත්මකභාවය සහ කාලීනභාවය ඉහළ නැංවීමට ද ඉමහත් දායකත්වයක් සපයනුඇතැයි අපේක්ෂා කෙරේ.

ඉ-සංගණනය මගින් රැස්කරනු ලබන තොරතුරු ශ්‍රී ලංකාවේ ආර්ථික ව්‍යුහය, කර්මාන්ත, වෙළෙඳ හා සේවා ක්ෂේත්‍රවල වර්ධන ප්‍රවණතා සහ ව්‍යාපාරික ක්‍රියාකාරකම් පිළිබඳ විශ්වසනීය සංඛ්‍යාන සම්පාදනය කිරීම සඳහා අත්‍යවශ්‍ය පදනමක් සපයයි. එමෙන්ම, එම තොරතුරු ජාතික සංවර්ධන සැලසුම්කරණය, ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනය, ආයෝජන ප්‍රවර්ධනය සහ සාක්ෂි මත පදනම් වූ තීරණ ගැනීම සඳහා ශක්තිමත් දත්ත පදනමක් සකස් කරනු ඇත.

සංගණනය සඳහා ලබාදෙන සියලුම තොරතුරු සංගණන ආඥාපනත (Census Ordinance) සහ සංඛ්‍යාලේඛන ආඥාපනත (Statistics Ordinance) යටතේ පූර්ණ රහස්‍යභාවයෙන් ආරක්ෂා කරනු ලැබේ. සංගණනයට සහභාගි වෙමින් ආයතනවලින් ලබාදෙන සියලුම තොරතුරු සංඛ්‍යානමය කටයුතු සඳහා පමණක් භාවිත කරනු ලබන අතර, පුද්ගල හෝ ආයතන මට්ටමේ තොරතුරු කිසිදු පාර්ශ්වයකට අනාවරණය නොකරන බව ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විශේෂයෙන් අවධාරණය කරයි.

ඉ-සංගණනය මගින් සිය තොරතුරු ඉදිරිපත් කිරීම සඳහා ලබා දී ඇති කාලය තුළ මාර්ගගතව තොරතුරු ලබා නොදෙන එහෙත් සේවක සංඛ්‍යාව 50ට වැඩි විශාල ආයතනවලින් දත්ත රැස්කිරීම සඳහා, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඉදිරි දිනෙක එම ආයතනවලට පැමිණෙනු ඇත. කෙසේ වෙතත්, ගණන් ගන්නා නිලධාරීන් ආයතනවලට පැමිණ සුපුරුදු මෙවලම් භාවිතයෙන් දත්ත රැස්කිරීම

සඳහා වැයවන කාලය අවම කර ගැනීමේ අරමුණින් හා ආයතන සඳහා තොරතුරු ලබා දීමේදී පහසුවත් සලකා හැකිතාක් දුරට සියලුම ආයතන ඉ-සංගණන පද්ධතිය භාවිත කරමින් තම තොරතුරු ස්වයංක්‍රීයව ඉදිරිපත් කරන ලෙස ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව සියලු කර්මාන්ත, ඉදිකිරීම් හා වෙළෙඳ හා සේවා සපයන ආයතනවලින් කාරුණිකව ඉල්ලා සිටියි.

ශ්‍රී ලංකාවේ නවීන, දත්ත මත පදනම් වූ තිරසර ආර්ථික සංවර්ධනයට අවශ්‍ය විශ්වාසනීය සංඛ්‍යාන තොරතුරු සම්පාදනය සඳහා අත්‍යවශ්‍ය වන මෙම ජාතික සංඛ්‍යානමය කාර්යය සාර්ථකව ඉටු කිරීම සඳහා, සියලුම අදාළ ආයතනවල පූර්ණ සහයෝගය සහ සක්‍රිය දායකත්වය ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව ගෞරවයෙන් අපේක්ෂා කරයි.

**ඉ -සංගණන පද්ධතිය සඳහා ලියාපදිංචි වීම;**

ඉ-සංගණන ක්‍රමවේදය යටතේ තොරතුරු ලබාදීමට අපේක්ෂා කරන, සේවක සංඛ්‍යාව 50 හෝ ඊට වැඩි සියලුම කර්මාන්ත, ඉදිකිරීම්, වෙළෙඳ හා සේවා ආයතන, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය වෙත පිවිස, පළමුව ලියාපදිංචි වන ලෙස කාරුණිකව දැනුම් දෙනු ලැබේ. ලියාපදිංචියෙන් අනතුරුව, අදාළ ආයතනය සඳහාම සකස් කරන ලද සබැඳියක් ඊ-තැපැල මඟින් ලබාදෙන අතර, එම සබැඳිය භාවිත කරමින් සංගණන තොරතුරු සෘජුවම මාර්ගගතව (Online) ලබාදිය හැකිය.

ලියාපදිංචිය සඳහා:- ecensus.ecsl.statistics.gov.lk හෝ www.statistics.gov.lk

K M D S D Karunaratne

කේ.එම්.ඩී.එස්.ඩී. කරුණාරත්න
අධ්‍යක්ෂ ජනරාල්
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
2026 ජූලි 01, කොළඹ

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ දැක්ම**

"රටේ සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා කාලෝචිත සංඛ්‍යානමය තොරතුරු සැපයීමේ කලාපීය නායකයා වීම."

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ මෙහෙවර**

"ගෝලීයකරණය වූ පරිසරයක් තුළ සෞභාග්‍යමත් ජාතියක් බවට පත්වීම සඳහා, උපායමාර්ගික නායකත්වයක් යටතේ කැපවූ කාර්ය මණ්ඩලයක සේවය උපරිමයෙන් ලබාගනිමින්, නවීන තාක්ෂණය භාවිතයෙන් වඩාත් ඵලදායී ලෙස නිවැරදි හා කාලෝචිත සංඛ්‍යාන සැපයීම මඟින් රටේ සමාජ-ආර්ථික සංවර්ධනයට දායක වීම."


ජනලේඛන හා සංඛ්‍යාලේඛන
දෙපාර්තමේන්තුව
"සංඛ්‍යාන මන්දිරය"
අංක 306/71,
පොල්දූව පාර,
බත්තරමුල්ල.

information@statistics.gov.lk
+94 11 2147000
+94 11 2147400
+94 11 2147011
www.statistics.gov.lk

**මෙම ප්‍රකාශනය කර්මාන්ත, ඉදිකිරීම්, වෙළඳ හා සේවා අංශය විසින් සකස් කරන ලද්දකි.**

5 වන මහල, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
industries@statistics.gov.lk
+94 11-2147405
+94 11-2147412